# INFORMATION SYSTEMS
# (Part - I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# දත්ත

පරිසරයේ හෝ සංවිධානයක සිදු වන නොයෙකුත් සිදු වීම් මඟින් හා ව්‍යාපාරික ගනුදෙනු මඟින් ජනිත වන මූලික කරුණු හා සංඛ්‍යා දත්ත ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

- සේවකයාගේ වැටුප හා නම ගනුදෙනුවක් සිදු වූ වේලාව හා වටිනාකම,
- මාසික විදුලි ගාස්තුව යනාදී.

## දත්ත ඉදිරිපත් කළ හැකි ක්‍රම

රූපමය දත්ත : භාණ්ඩවල ඡායාරූප

සංඛ්‍යාමය දත්ත: භාණ්ඩවල මිල ගණන්

ශ්‍රව්‍යමය දත්ත : පටිගත කරන ලද පාරිභෝගික අදහස්

දෘශ්‍යමය දත්ත : මිල ගණන් දැක්වෙන නාමපුවරු

ClassWork.LK

## තොරතුරු

තේරුම් ගත හැකි ලෙස හා ප්‍රයෝජනයට ගත හැකි ලෙස සකස් කරන ලද දත්ත තොරතුරු ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

ව්‍යාපාරයේ දළ ලාභ අනුපාතිකය, ඒකකයක විකුණුම් පිරිවැය, වාර්ෂික මුළු විදුලි වියදම, මුළු නිෂ්පාදන ඒකක ප්‍රමාණය


ClassWork.LK

# දත්ත හා තොරතුරු අතර දැකිය හැකි වෙනස්කම්

| දත්ත | තොරතුරු |
|---|---|
| ▪ දත්ත යෙදවුමකි.<br><br>▪ දත්ත තීරණ ගැනීම සඳහා සෘජු ව ම භාවිත කළ නොහැකි ය<br><br>▪ දත්ත දත්ත වශයෙන් පවතින තෙක් වටිනාකමක් ගෙන නොදේ. | ▪ තොරතුරු නිමැවුමකි<br><br>▪ තොරතුරු තීරණ ගැනීමට සෘජු ව ම භාවිත කළ හැකිය .<br><br>▪ තොරතුරුවලින් වටිනාකමක් ගෙන දේ |

ClassWork.LK

## දත්ත සැකසුම් ක්‍රියාවලිය මගින් දත්ත තොරතුරු බවට පරිවර්තනය වන ආකාරය




## දත්ත සැකසුම් ක්‍රියාවලියට අයත් කාර්ය

### 1. වර්ගීකරණය (Classifying)

දත්ත ඒවායේ ලක්ෂණ අනුව කොටස්වලට වෙන් කිරීමයි.

### 2. තේරීම් (Sorting)

දත්ත සුවිශේෂ පිළිවෙළකට සැකසීම යි.

ClassWork.LK

### 3. ගණනය කිරීම (calculating)

දත්ත අංක ගණිතමය හෝ තර්කානුකූල හෝ ක්‍රියාවලියකට භාජනය කිරීම යි.

### 4. සාරාංශකරණය (Summarising)

දත්තවලින් යම් අදහසක් ඇති කර ගත හැකි ආකාරයට කෙටි කර දැක්වීම යි.

## <u>දත්ත සැකසීමේ තාක්ෂණය වර්ගීකරණය</u>

- **<u>හස්ත ක්‍රමය (අත් හුරු ක්‍රමය) (Manual)</u>**

පෑන්, පැන්සල්, කඩදාසි හා ලිපිද්‍රව්‍ය වැනි උපකරණ භාවිතයෙන් අතින් සිදු කරනු ලබන දත්ත සැකසීම යි.

දත්ත සැකසීමේ උපකරණ :

- පෑන්, පැන්සල්, කඩදාසි හා ලිපිද්‍රව්‍ය

ClassWork.LK

## • අර්ධ හස්ත ක්‍රමය (Semi Mannual)

යතුරු ලියනය වැනි ප්‍රාථමික මට්ටමේ දත්ත සැකසුම් යන්ත්‍ර සහ මිනිස් ශ්‍රමය භාවිතයෙන් දත්ත සැකසීම සිදු කරයි.

දත්ත සැකසීමේ උපකරණ :

- යතුරු ලියනය

## • විද්‍යුත් යාන්ත්‍රික (Elctro Mechanical)

විද්‍යුත් යතුරු ලියනය වැනි ස්වයංක්‍රිය දත්ත සැකසුම් යන්ත්‍ර භාවිත කර දත්ත සකස් කිරීම.

දත්ත සැකසීමේ උපකරණ :

- විද්‍යුත් යතුරු ලියනය

ClassWork.LK

- **විද්‍යුත් (Electronic)**

පරිගණක භාවිතයෙන් ස්වයංක්‍රිය ව දත්ත සැකසීම සිදු වේ. ඉතා පහසුවෙන් නිවැරදි ව දත්ත සැකසීම කළ හැකි ය.

දත්ත සැකසීමේ උපකරණ :

- පරිගණකය

ClassWork.LK

# විවිධ නිර්ණායක පදනම් කර ගෙන තොරතුරු වර්ග කරන ආකාරය

| නිර්ණායකය | තොරතුරු වර්ග |
|---|---|
| ▪ මූලාශ්‍රය අනුව | ▪ බාහිර, අභ්‍යන්තර, මූලික, ද්විතීයක |
| ▪ ස්වභාවය අනුව | ▪ ප්‍රමාණාත්මක, ගුණාත්මක |
| ▪ කළමනාකරණ මට්ටම් අනුව | ▪ උපක්‍රමික, උපාය මාර්ගික, මෙහෙයුම් |
| ▪ කාලය අනුව | ▪ අතීත, වර්තමාන, අනාගත |
| ▪ නියත හා සම්භාවිතාව අනුව | ▪ නියත, සම්භාවිතාත්මක |
| ▪ කළමනාකරණ ශ්‍රිතය අනුව | ▪ මූල්‍ය, මෙහෙයුම්, අලෙවිකරණ, මානව සම්පත |
| ▪ සමූහ ගත වීම හා වෙන් කිරීම අනුව | ▪ සමූහ ගත තොරතුරු, වෙන් කරන ලද තොරතුරු |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura